# සිංහල බෞද්ධයා - පන්සල - සහ හැසිරීම

අමරාවතී විහාරයට ගියාම හිතට මොන තරම් සුවයක් ලැබෙනවද? මොන තරම් නිසංසලද? ආදී වශයෙන් ඔබ කී දෙනෙක් පවසා ඇද්ද? මමත් අහන්නෙ ඒ ප්‍රශ්නයමයි. එම ප්‍රශ්නයට උත්තර සොයන්න මම මහන්සි වෙනවා. ඒ හැර අමරාවතී විහාරයත්, එහි සිදු වන කටයුතුත්, අපගේ අනෙක් බෞද්ධ විහාරස්ථානවල සිදු කෙරෙන ආගමික වත්පිළිවෙත් සමග සංසන්දනයක් කිරීමට මා කිසිසේත් බලාපොරොත්තු වන්නේ නැහැ.

බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් වැනි ඕනෑම පූජ්‍ය ස්ථානයක මුලින්ම දක්නට ලැබෙන්නෙ එහි ඇති නිසංසල, නිස්කලංකභාවය. ඒ නිසංසල කම බැතිමතුන්ගේ සිත්හි ඇති භක්තිය දෙගුණ තෙගුණ කරයි. පුදසුන මත දැල්වෙන මැටි පහනේ හෝ ඉටි පහනේ ගිනි සිළුව නොසැලෙන මෙන් දැල් වෙන හැටි ඔබ කොතෙකුත් දැක ඇතැයි සිතමි. හේතුව අවට ඇති සන්සුන් බව නිසා-යයි අමුතුවෙන් කිව යුතු නැහැ.

අවාසනාවකට මෙන් එක්සත් රාජධානියේ ඇති සිංහළ බෞද්ධ විහාරස්ථාන බොහො මයක මා ඉහතින් සඳහන් කළ නිසංසලකම කලාතුරකින්වත් දක්නට නැතිවීම කණගාටුවට කරුණක්. එයට හේතු මොන වාදැයි සොයා බැලීම වටිනවා.

මා මුලින් කී අමරාවතී විහාරයේ ඇති සන්සුන් පරිසරය ගැන පවසන අයමයි සිංහල විහාරස්ථාන කරා පැමිණෙන්නේත්. නමුත් ඒ උදවිය ඒ අපේ විහාරස්ථාන වලදී නිශ්ශබ්දතාවය රකින්නට, සංවරව හැසිරෙන්නට එතරම් උත්සාහයක් ගන්නෙ නැහැ. කොටින්ම ඒ අය අමතක කරනවා මේ ඇවිත් ඉන්නෙ ගරුසරුව හැසිරිය යුතු තැනකටය කියන කාරණය. ඒ 'අපේ පන්සල' කියන හැඟීම නිසාද කියා මට හිතෙනවා.

කිසියම් අවශ්‍යතාවකට අන්‍ය ආගමික පූජ්‍යස්ථානයකට ගිය කල එම ස්ථායට ඇති ගරු සැලකිල්ල හා සිතුවිල්ල නිසාම අපේ බෞද්ධ උදවිය ඉතා අගේට හැසිරෙනවා. කටින් වචනයක්වත් පිටකරන්නෙ නැහැ නිශ්ශබ්දතාව බිඳවැටෙයි කියා. හුස්ම ගන්නෙත් ප්‍රවේශමෙන්. අවශ්‍ය වුනොත් ළඟම ඉන්න කෙනාට වචනයක් හරි කියන්නෙ රහසෙන් වගේ ඇහෙන නැහෙන ගාණට.

හැබැයි මෙන්න ඒකට අපේ පන්සලකට ගියාම, ඒ අයගෙ හැසිරීම අන්තිමයි. කව කවේ නිසාම කන් දෙක පැලෙන්න එනවා. හරියට මහරගම ඉරිදා පොළට ගියා වගේ. මහ හයියෙන් ආගිය තොරතුරු අහනවා. කොක්හඬ දාලා හිනාවෙනවා. පොඩි එවුන් කානිවල් එකකට, සෙල්ලම් පිට්ටනියකට ගියාවගේ එකා පස්සෙ පන්නමින් විහාරය සිසාරා දුවනවා. හැංගිමුත්තන් ගහනවා. දෙමව්පියන්ද ඒව නොපෙනුණා වගේ එකිනෙකා හා අල්ලාප සල්ලාපයේ යෙදෙන්නෙ අවුරුදු ගණනකට පස්සෙ හදිසියේ මුණගැහුණා වගේ. "අනේ පොඩි එවුන් ටිකක් පන්සල ඇතුලේ දිව්වම මොකද වෙන්නෙ" කියලා සමහර දෙමව්පියො කියනවා. "හාමුදුරුවන්ට වත් බැරිද පොඩ්ඩක් කියන්න නිශ්ශබ්ද වෙන්න කියලා." තව කෙනෙක් අහනවා. "හාමුදුරුවන්ට වෙන වැඩ නැද්ද?" කියලා තව කෙනෙක් කියනවා. කාට කාටත් නිශ්ශබ්ද වෙන්න කියලා කිව්වොත් දායකයන්ගෙ හිත් අමනාප වෙයි කියලා හාමුදුරුවරු හිතනවා ඇති.

හාමුදුරුවරු දානය වළඳන වෙලාවට ධර්ම ශාලාවට වදින පොඩි ඇයො භාවනාකිරීමට බිම ඉඳගන්න අපහසු අයට තියලා තියන පොඩි රවුම් කොට්ටවලින් පුට් බෝල් ගහ නවා අප කොච්චරවත් දැකලා තියනවා. ඒ ළමයින්ගෙ අම්මලා බලන්නෙවත් නැහැ තමන්ගෙ දරුවො මොනව කරනවාද කියලා. අම්මලා ඉන්නෙ වෙනම ඕපදූප ලෝකෙක. ගෙදර යන්න කිට්ටු වුනාමයි හොයන්නෙ කෝ දරුවො කියලා.

වැඩි කාලයක් නැහැ, මේ පහුගිය වෙසක් පෝය දවසෙ ලන්ඩන් පන්සල්වල ඇතුළෙ පමණක් නෙවෙයි ඇතුල් වෙන දොරටුව ළඟ කෑකෝ ගගහ කතාකරන, ඒවගේම පාටියකට යන්න වගේ හිරවෙච්ච විසිතුරු ඇඳුම් ඇඳගත්තු තරුණ ගැහැණු ළමයි මහා සද්දෙන් කරන කතාව පෝය දවසෙ පූජණීය ස්ථානයකට ගිහිං හැසිරෙන විදිය නම් නෙවෙයි. අනේ කියලා හිතුණා.

ක්‍රිස්තියානි දේවස්ථානවල පූජා වට සහභාගි වන ළමයි හැසිරෙන සංවර ආකාරය අපි අනන්තවත් දැකලා තියනවා. කෑකෝ ගැහීමක්, හඬ නගා කතාකිරීමක් දුව පැන ඇවිද "මක් ඒවායෙ නැහැ. ඒවට ඉඩක් නැහැ. මුස්ලිම් පල්ලියෙත් ළමයි හැසිරෙන ඉතාම විනීතව. එතැන අන් හැම තැනටම වඩා සංවරකම හා විනය රැකීම තියනවා. සිංහළ බෞද්ධයා පමණයි පූජනීය ස්ථානයක හැසිරෙන්න නොදන්නෙ.

මට මේ අවස්ථාවෙ දැනට වසර හතළිහකට පමණ ඉස්සර වුණු දෙයක් මතක් වෙනවා. අපේ ගම වන දෙහිවල නැදිමාලෙට කිට්ටුම විහාරස්ථානය තමයි බෙල්ලන්විල රජ මහා විහාරය. ඒකාලෙ හිටියෙ බෙල්ලන්විල සෝමරතන නායක හාමුදුරු-වො. (දැන් ඉන්න විමලරතන නායක හාමුදුරුවන්ගේ ගුරු හාමුදුරුවො) ඒ හාමුදුරුවො හරි සැරයි. පෙරහැර කාලෙ දවසක් හැන්දෑවෙ ළමයි වගයක් මල් ආසනේ වටේ දුව දුව අනෙක් බැතිමතුන්ට හිරිහැර-වෙන විදියට කෑගගහ, සෙල්ලමට මල්වලින් ගහගන්න පටන් ගත්තා. ලොකු හාමුදුරු-වො ඇවිත් ඒ ළමයි දෙන්නෙක් අල්ල ගත්තා. එතන පෙරහැරේ වැඩට ගෙනා කෝටුවගයක් තිබුණා. ඒ කෝටුවක් අරන් අර කොල්ලො දෙන්නට හොඳටම ගැහුවා. ගහලා, තොපි ආයිත් එහෙම මේ පන්සලේ පස් පෑගුවොත් බලාපියව් තොපිට කරනදේ පලයව් යන්න කාලකණ්නි හැත්ත කියලා එළවලා දැම්මා. ඒක බලන් හිටි කවුරුත් කිව්වෙ හොඳ වැඩේ කියලා. හාමුදුරුවරු ඉස්සර එහෙමයි පන්සලේ විනය ගෞරවය රැක්කෙ.

තරහ වුනත් කරන්න දෙයක් නැහැ, මම නම් හිතන්නෙ භික්ෂූන් වහන්සේලා ලන්ඩනයේ ඉන්න මේ සිංහල ගිහියන්ට පහදල දෙන්න ඕන පන්සලකට ගියාම හැසිරෙන විදිය. දරුවන් හසුරුවන විදිය. හැසිරෙන්න දන්නෙ නැත්නම් ඒ අය පන්සලට නාවට කමක් නැහැ. වියදම්කරලා මහන්සි වෙලා දරුවන්ට ඉහළට උගන් නනවා වගේම, ඒ දරුවන්ට තැනකට ගියාම තැනට ඔබින විදියට හැසිරෙන හැටිත් කියා-දෙන ගමන් දෙමාපියනුත් ඒක ඉගෙන ගත්තොත් හොඳය කියලා මම හිතනවා.

♦ **විල්ප්‍රඩ් පෙරේරා**
**Berks UK**

## එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා ආදි ශිෂ්‍ය සංගම් ඒකරාශිව සංවිධානය කරන

# මහා ක්‍රිකට් සැණකෙළිය






# ලංකාවේ මොළේ පොලොස්ද?

අප වාසය කරන මෙල්බර්න් නගරයේ ලාංකික වෙළඳ සැලකට ගිය මම ලංකාවෙන් ගෙන්වන ලද නොයෙක් කෑම වර්ග අතර වූ පොළොස් ටින් එකක් මිළදී ගතිමි. එය දුටු ගමන් මට හිනා ගියේ ලේබලයේ සඳහන් කර ඇති දෙයටය. එනම් **Polos in Brain** යන්නයි. එහි සටහන් විය යුත්තේ **Polos in Brine** යනුවෙන් බව නිසැකය. එනම් ලුණු වතුරේ දැමූ පොලොස් යන්නය. මෙය වැරදීමක් වුවත් මහා පරිමාණයේ වැරදීමකි. විදේශයට බඩු යවන විට ලංකාව කොතරම් නොසැලකිලිමත්දැයි මෙයින් වැටහේ. මොළේ පොලොස් වුවත් මෙලෙස ලෝකයාටම හඬගා, දැන්වීම් ගසා ඒ බව ප්‍රචාරය කරන්නේ ඇයි?

දැන් ඒ ලංකා කඩයට ගිය විට අපි මුදලාලිගෙන් අසන්නේ තවම මොළේ පොලොස්ද කියායි.

♦ **සිසිල් විජේසිංහ** **Melbourne, Australia**





මනා

අගනුවරට නොදුරු සි/බො/ගො 31, 5.8 අයි/වී උපදේශක ව්‍යාපාරික සම ගතිගුණ ඇති යුවතියක් සොයන්නෙමු. නිර්මාංශි මදුරුවන් නොමරණ මත්ස්‍යමාංශ බිත්තර මද්‍යසාර බිඳක්වත් අඩංගු ආහාර නොසාදන, නළුනිළියන්/ ගායකයන්/ ක්‍රීඩකයන්/ නවකතා /ක්‍රීඩාතරග භාවනාපංති ප්‍රිය නොකරන පුරුෂෝත්තමභාවය පිළිග-

# අපූරු මංගල දැන්වීමක්

**මේ මෑතක ශ්‍රීලංකාවේ ලංකාදීප පත්‍රයේ මෙම දැන්වීම පළවී තිබුණි. ඒ මෙසේය.**

අගනුවරට නොදුරු, සි/ බො/ ගො/ 31, 5.8 අයි වී උපදේශක, ව්‍යාපාරික, සම ගතිගුණ ඇති යුවතියක් සොයන්නෙමු. නිර්මාංශී, මදුරුවන් නොමරණ, මත්ස්‍යමාංශ, බිත්තර, මධ්‍යසාර බිඳක්වත් අඩංගු ආහාර නොසාදන, නළුනිළියන්, ගායකයන්, ක්‍රීඩකයන්, නව කතා, ක්‍රීඩා තරඟ, භාවනා පංති ප්‍රිය නොකරන, පුරුෂෝත්තමභාවය පිළිගන්නා, නේවාසිකාගාරවල නොසිටි, සංගීතයට කාය විකාරයන් වාග්විකාරයන් පළනොකරන, දමාපියන්ට වැඩිහිටියන්ට සලකන, සතුන් කූඩුවල ටැංකිවල සිරනොකරන, බේත්පෙත්තට වඩා කසාය හැලියේ ගුණ අගයන, දේශීයව හදින පළ දින, පරදේශක්කාර මංගල චාරිත්‍ර වෙනස්කර සරල සිංහල මංගල්‍යයකට එකග නම් පමණක් කේන්ද්‍ර පිටපත සමග ලියා දන්වන්න. මංගල කිංකිණී 413 තැ පෙ 2047 කොළඹ